# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1,504/6 – 2007 ජූලි 03 වැනි අඟහරුවාදා – 2007.07.03

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

### පළාත් සභා නිවේදන

සබරගමුව පළාත් සභාව

සබරගමුව පළාත් සභාවේ 2006 අංක 05 දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය

සාභිකය සටහන් කළේ : 2006.12.21
අනුමැතිය ලැබුනේ : 2007.06.11

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදි,

ශ්‍රියානි පද්මලතා,
සභා ලේකම්.

සභා ලේකම් කාර්යාලය,
සබරගමුව පළාත් සභාව.

2006 අංක 5 දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය

සබරගමුව පළාතේ ග්‍රාම සංවර්ධන සංවිධාන ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණ, ප්‍රජා නායකත්ව පුහුණුව සහ පුහුණු මධ්‍යස්ථාන පවත්වාගෙන යාම, ග්‍රාම සංවර්ධන කලාප පිහිටුවීම, ප්‍රාදේශීය බල මණ්ඩල පිහිටුවීම, දිස්ත්‍රික් බල මණ්ඩල හා පළාත් බල මණ්ඩල පිහිටුවීම සහ පවත්වාගෙන යාම අරභයා අවශ්‍ය විධිවිධාන සැලැස්වීමද, එයට සම්බන්ධව හෝ ආනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම ද සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ, පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :

1. මෙම ප්‍රඥප්තිය සබරගමුව පළාතේ පළාත් සභාවේ 2006 අංක 5 දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලද දින සිට ක්‍රියාත්මක වන්නේය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය

2. (අ) පළාත් සභා බල ප්‍රදේශයේ ජනතාවගේ සහභාගීත්වයෙන් ආර්ථික, සමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික හා අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා ග්‍රාම සංවර්ධන සමිති පිහිටුවීමට අනුබල දීම. පරමාර්ථය සහ කාර්යභාරය

(ආ) ලියාපදිංචි කිරීම.

(ඇ) අධීක්ෂණය කිරීම.

(ඈ) ප්‍රජා නායකත්ව පුහුණු කිරීම.

(ඉ) පළාත් සභාවේ සංවර්ධන ප්‍රතිපත්ති පිළිබඳව දැනුවත් කිරීම, සහ

(ඊ) සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශ ඔස්සේ සංවිධාන මෙහෙයවීමට උපදෙස් දීම.

සංවිධාන ව්‍යුහය.

3 I. ග්‍රාම සංවර්ධන විෂය භාර ලේකම්වරයා මේ ප්‍රඥප්තිය පිළිබඳ ප්‍රධාන බලධරයා විය යුතුය.

II. අමාත්‍යාංශයේ ලේකම්වරයාට සහාය වීම පිණිස කෑගල්ල හා රත්නපුර දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරීන් දෙදෙනෙක් පත්කල යුතුය.

III. ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය නායකත්ව පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහාත්, සුදුසු මධ්‍යස්ථාන භාරව සිටීම සඳහාත් දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරීවරයෙකු පත්කල යුතුය.

IV. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් දිස්ත්‍රික් නිලධාරීන්ට සහායවීම පිණිස ග්‍රාම සභා සමායෝජකයින් පත්කල යුතුය.

4 I. ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මුලින් මේ දක්වා පිහිටුවනු ලැබ ඇති සියළුම ග්‍රාම සංවර්ධන සමිති, කාන්තා සමිති මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට මාස 03 ක කාලයක් තුළ ප්‍රතිසංවිධානය වෙමින් නැවත ලියාපදිංචි විය යුතුය.

II. ඉහත වගන්තිය අනුව එම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට නව ග්‍රාම සංවර්ධන සමිති පිහිටුවීම හා ලියාපදිංචි කිරීම නව ව්‍යවස්ථාව හා රීති අනුව සිදුකල යුතුය;

III. ඉහත ග්‍රාම සංවර්ධන සමිතිවලට අදාළ වන ව්‍යවස්ථා මාලාව ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමත කරනු ලැබිය යුතුය.

අරමුදල්

IV. රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්ක සඳහා වෙනම දිස්ත්‍රික් අරමුදල් දෙකක් පවත්වාගෙන යා හැකිය.

එම අරමුදල පහත සඳහන් ප්‍රභවයන්ගෙන් සමන්විතය.

(අ) පළාත් සභා මගින් වාර්ෂික මුදල් ප්‍රකාශය මගින් වෙන්කර දෙනු ලැබිය හැකි ප්‍රතිපාදන.

(ආ) රජය මගින් ලබා දිය හැකි විදේශීය ප්‍රදාන

(ඇ) යම් පුද්ගලයෙකු හෝ ආයතන මගින් කරන පරිත්‍යාග

(ඈ) ග්‍රාම සංවර්ධන සමිති විසින් ඉදිකිරීම් කොන්ත්‍රාත් මගින් උපයන ආදායමෙන් අයකරනු ලබන මුදල්.

(ඉ) ලොතරැයි සංදර්ශන හෝ වෙනත් අනුමත ක්‍රම මගින් ලැබෙන මුදල්.

අරමුදල් පාලනය

5 (අ) මෙම කාර්යය සඳහා විෂය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍යාංශ ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් 07 දෙනෙකුගෙන් යුත් අරමුදල් කමිටුවක් පත් කළ යුතුය.

I. මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය පරිදි එක් අයෙකුද

II. පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය පරිදි එක් අයෙකුද;

III. සමාජ සේවා විෂය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය පරිදි එක් අයෙකුද:

IV. සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය පරිදි එක් අයෙකුද:

V. ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය පරිදි දෙදෙනෙකුද, එයින් එක් අයෙක් පළාත් කමිටුවේ සාමාජිකයෙක් විය යුතුයි.

(ආ) මෙම අරමුදල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වෙනි වගන්තිය ප්‍රකාර විගණනයට යටත් වේ.

අරමුදලේ කාර්යභාරයන්.

6 I. ප්‍රජා නායකත්ව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආධාර කිරීම.

II. ඒ ඒ වසරේ ඵලදායී ලෙස ප්‍රජා සහභාගීත්වයෙන් ව්‍යාපෘති කරන ලද සංවිධාන හා ප්‍රජා නායකයන් ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් ඇගයීමට ලක් කිරීම හා ඒ වෙනුවෙන් සම්මාන තිළිණ හෝ ත්‍යාග මුදල් පිරිනැමීම;

III. කාලීන ලෙස සංවර්ධනයට ඉවහල් වන ක්ෂේත්‍ර හඳුනාවා දීම, ක්‍රියාත්මක කිරීම සහ සහාය වීම. සිවිල් සමාජය ශක්තිමත් කිරීමට අදාළ වන ආරවුල් පමණය.

IV. ආර්ථික, ආගමික, සාමාජීය හා සදාචාරාත්මක වර්ධනයෙහිලා ඵලදායී වනපැති හඳුනාවාදීම හා ක්‍රියාත්මක කිරීමට රුකුල් දීම:

7. I. ග්‍රාම සංවර්ධන සමිතිවල පැන නැගෙන ආරවුල් පිළිබඳව විසඳුම් හා තීරණ විෂය භාර ලේකම්වරයා විසින් ලබාදිය යුතුය. ආරවුල් බේරුම් කිරීම.

II. එම තීරණයෙන් සෑහීමකට පත් නොවන සංවිධානයකට හෝ පුද්ගලයෙකුට විෂය භාර අමාත්‍යවරයාට අභියාචනා කළ හැකිය. අමාත්‍යවරයාගේ තීරණය අවසාන තීරණය විය යුතුය.

8. මෙම ප්‍රඥප්තියේ අදාළ වන කාර්යයන් සඳහා නියෝග, විෂයභාර අමාත්‍යවරයා විසින් පැනවිය හැකි අතර පළාත් සභාවේ අනුමැතිය ලබා ගත යුතුය. නියෝග හා නීති සම්පාදනය.

9. I. ග්‍රාම සංවර්ධන සමිති සඳහා පළාත් සභා අරමුදලින් ඉදිකරනු ලැබූ සියළු ගොඩනැගිලිවල පූර්ණ අයිතිය සබරගමුව පළාත් සභාව සතුවන අතර භාරකාරත්වය පමණක් ලියාපදිංචි ග්‍රාම සංවර්ධන සමිතිවලට හිමි වේ. ග්‍රාම සංවර්ධන සමිති සතු නිශ්චල චංචල දේපළ.

II. ග්‍රාම සංවර්ධන සමිති සතු අනෙකුත් චංචල හෝ නිශ්චල දේපල වලද පූර්ණ අයිතිය සබරගමුව පළාත් සභාව සතුවන අතර භාරකාරත්වය අදාළ සමිතියට අයත් වේ.

III. ග්‍රාම සංවර්ධන සමිති සතු යම් නිශ්චල දේපලකට අයත් ගොඩනැගිල්ලක්, ඉඩමක් හෝ ස්ථාවර දේපලක් සම්බන්ධව කඩා ඉවත් කිරීම, අළුතින් සෑදීමට ව්‍යුහය වෙනස් කිරීම ආදී ඕනෑම කටයුත්තකදී අමාත්‍යාංශ ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

10. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

කෙටි හැඳින්වීම :

"ග්‍රාම සංවර්ධන සංවිධාන" සබරගමුව පළාතේ ග්‍රාමීය හා නාගරික ප්‍රජාව විසින් ස්වකීය ආර්ථික, සාමාජික, ආගමික, සංස්කෘතික, අධ්‍යාපනික, සදාචාර දියුණුව අරභයා පිහිටුවා ගනු ලබන සංවිධාන අදහස් කෙරේ. අර්ථ නිරූපණය.

සබරගමුව පළාත් සභාව මගින් පනවන ලද යම් ප්‍රඥප්තියක් යටතේ ලියාපදිංචි කර ඇති සංවිධාන යන්න අදහස් කෙරේ. "ලියාපදිංචි සමිති."

07-355